රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01 /2016

මාගේ අංකය :IAD/GA 03/විවිධ 11
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.
2016.01.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය හා විශේෂ දිනය ක්‍රියාවට නැංවීම -2016 ජනවාරි 25-30**

ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක SP/SB/09/15 මගින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව 2016 ජනවාරි 25 වන දින සිට 30 වන දින දක්වා **"ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය"** ලෙසද ජනවාරි 30 වන දින ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන විශේෂ දිනය ලෙසද රජය විසින් ප්‍රකාශයට පත්කොට ඇත. ශ්‍රී ලංකාව තුල සීඝ්‍රයෙන් ඉහළ යන බෝ නොවන රෝග පිළිබඳ තත්ත්වයන් පාලනය කිරීම සඳහා මෙම ජාතික වැඩසටහන මගින් සාර්ථක ආරම්භයක් ලබා දීම මෙහි එක් අරමුණකි.

02. ඒ අනුව 2016 ජනවාරි 25 දින **"රාජ්‍ය හා රාජ්‍ය සේවා - ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන දිනය"** ලෙස නම් කර ඇත. නිරෝගී රාජ්‍ය සේවකයින් මගින් කාර්යක්‍ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතනවල ශරීර සුවතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. එහි මූලික පියවර ලෙස 2016 ජනවාරි 25 දින පෙ.ව.8.30 සිට පහත සඳහන් වැඩපිළිවෙල යොදාගත යුතුය.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම.

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. නිරෝගී ජීවිතයක් තුළින් කාර්යක්‍ෂම ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීම සඳහා ශරීර සුවතා ව්‍යායාම හා පෝෂණයෙහි ඇති වැදගත්කම පිළිබඳව කෙටි දේශනයක් පැවැත්වීම

IV. සියලුම කාර්ය මණ්ඩලයට කාර්යාලයීය ඇඳුමින් සහභාගී විය හැකි සරළ ව්‍යායාම වැඩසටහන් (මිනිත්තු 15ක) ක්‍රියාත්මක කිරීම.

03. නිරෝගී රාජ්‍ය සේවකයින් මගින් කාර්යක්‍ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමේ අරමුණ සාර්ථක කර ගැනිම සඳහා සුදුසු වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මුලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ජේ.දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත්- 1. ගරු පළාත් ආණ්ඩුකාරවරුන්
2.ජනාධිපති ලේකම්
3. ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය - සුදුසු ශාරීරික යෝග්‍යතා උපදේශකවරුන් සියලුම රාජ්‍ය ආයතන වෙත යොමු කිරීමට